මැතිවරණ කොමිෂන් සභාව

කොන්ත්‍රාත් පදනම මත කාර්මික නිලධාරී (සිවිල්) තනතුර සඳහා බඳවා ගැනීම

මැතිවරණ කොමිෂන් සභාවේ දැනට පුරප්පාඩු වී පවතින කාර්මික නිලධාරී (සිවිල්) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **රාජකාරී ස්වභාවය** - මැතිවරණ කොමිෂන් සභාවේ හා ඒ යටතේ ඇති සියළුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල නව ඉදිකිරීම් , වැඩිදියුණු කිරීම් හා අලුත්වැඩියා කිරීම් සඳහා වන වැඩ පරීක්ෂා කිරීම සහ ඉදි කිරීම්වලට අදාළ සැලසුම් නිර්මාණය කිරීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම, නඩත්තු කටයුතු අධීක්ෂණය කිරීම, ගෙවීම් සඳහා ඉදිරිපත් කරන ලේඛන පරීක්ෂා කර නිර්දේශ ඉදිරිපත් කිරීම හා තනතුරට අදාළව මැතිවරණ කොමිෂන් සභාව හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරී කටයුතු.

02. **අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්**

- මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව හෝ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව හෝ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව හෝ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම හෝ රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ - 06) මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම සමඟ **වසර තුනක පළපුරුද්ද** තිබිය යුතුය.
- ගොඩනැඟිලි ඇස්තමේන්තු කිරීම හා අධීක්ෂණය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.
- මනා පරිගණක සාක්ෂරතාවයක් තිබිය යුතුය.
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-45ත් අතර විය යුතුය.

03. සේවයේ යෙදවීමේ කොන්දේසි

- කොන්ත්‍රාත් කාලය තුළ රජයේ අනුමත චක්‍රලේඛවලට අනුව ආයතනික මට්ටමින් මාසිකව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) ආරම්භක වැටුප වන රු. 52,250.00 ක මුදලක් හා අදාළ වන පරිදි අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.
- මෙම පත්වීම වසරක කාලයක් සඳහා පමණක් වලංගු වන අතර, කොන්ත්‍රාත් පදනම මත තාවකාලිකව පමණක් බඳවාගැනීම සිදු කෙරේ.

සෑම ඉල්ලුම්කරුවෙකුම,

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීමට අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

අයදුම් පත් එවිය යුතු ආකාරය

සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහතින් දක්වා ඇති අයදුම්පත අදාළ සහතිකවල පිටපත් ද සමඟ **2026.11.23** දින හෝ ඊට පෙර ලැබෙන සේ **මැතිවරණ කොමසාරිස් ජනරාල්, මැතිවරණ මහලේකම් කාර්යාලය, සරණ මාවත, රාජගිරිය,** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"කොන්ත්‍රාත් පදනම මත මැතිවරණ කොමිෂන් සභාවේ කාර්මික නිලධාරී (සිවිල්) තනතුර සඳහා බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

2026.11.23 දිනට හෝ ඊට ප්‍රථම අයදුම්පත් යොමු කරන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් මැතිවරණ කොමසාරිස් ජනරාල් විසින් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් අනතුරුව මෙම තනතුර සඳහා සුදුසු අයෙකු තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව අවසාන තීරණය මැතිවරණ කොමිෂන් සභාව සතු වන අතර, සියළුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

රසික පීරිස්
මැතිවරණ කොමසාරිස් ජනරාල්

2026 නොවැම්බර් මස 02 දින
මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.

රසික පීරිස්
මැතිවරණ කොමසාරිස් ජනරාල්
මැතිවරණ කොමිෂන් සභාව
සරණ මාවත, රාජගිරිය.

<u>මැතිවරණ කොමිෂන් සභාව</u>

<u>කොන්ත්‍රාත් පදනම් මත කාර්මික නිලධාරීන් බඳවා ගැනීමේ අයදුම්පත්‍රය</u>

1. මුල් අකුරු සමඟ නම : .....
2. මුල් අකුරු වලින් හැඳින්වෙන නම : .....
   .....
3. උපන් දිනය : .....
4. ජාතික හැඳුනුම්පත් අංකය : .....
5. **2026.11.23** දිනට වයස : අවු..... මාස..... දින .....
6. ස්ථිර ලිපිනය : .....
7. ස්ත්‍රී/පුරුෂ භාවය : .....
8. විවාහක / අවිවාහක බව : .....
9. දුරකථන අංකය : ස්ථාවර .....
   ජංගම .....
10. විද්‍යුත් තැපැල් ලිපිනය : .....
11. අධ්‍යාපන සුදුසුකම්

I. අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර (කරුණාකර සහතිකවල පිටපත් අමුණන්න)

විභාගය සමත් වූ වර්ෂය : ..... විභාග අංකය : .....

විෂය	ශ්‍රේණිය	විෂය	ශ්‍රේණිය
1.		6.	
2.		7.	
3.		8.	
4.		9.	
5.		10.	

II අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර (කරුණාකර සහතිකවල පිටපත් අමුණන්න)

විභාගය සමත් වූ වර්ෂය: ..... විභාග අංකය : .....

විෂය	ශ්‍රේණිය
1.	
2.	
3.	
4.	

12. අනෙකුත් සුදුසුකම් : තාක්ෂණ/ වෘත්තීය (කරුණාකර සහතිකවල පිටපත් අමුණන්න)

ආයතනය	හදාරා ඇති පාඨමාලාව	කාලය

13. අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති පළපුරුද්ද:

.....
.....
.....
.....
.....
.....
.....

14. වෙනත් සුදුසුකම් : (උදා. පරිගණක සාක්ෂරතාවය)

.....
.....
.....
.....
.....
.....

15. අයදුම්කරුගේ ප්‍රකාශය :

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි.

දිනය : ....

අයදුම්කරුගේ අත්සන